# කැලේගම දෙස යෝනිසෝ මනසිකාරයෙන්

***එස්. එම්. කේ. බී. තන්දරත්න***
පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී

**මෙම ලිපියේ පරමාර්ථය වී ඇත්තේ, ගොවි කටයුතු පර්යේෂණ ආයතනය විසින් දියත් කළ කැලේගම කුඩා වැව් පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳව සාකච්ඡා කිරීමයි.**

කැලේගම කුඩ වැව් පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය පුරාණ වැව් පහක් අලුත්වැඩියා කිරීම අරමුණු කොට ගෙන 1992 බිහිවිය. පුරාණ වැව් පහ නම්,

* පාලු වැව
* කැලේගම වැව
* පුපුල වැටිය
* හපුකුඹුර
* ඉහළගම වැව යනුයි.

මෙම වැව් පහ යටතේ මුල් සැළසුම් අනුව අක්කර 102 ක් වගා කළ හැකි අතර යැපෙන පවුල් සංඛ්‍යාව 169 පමණ වෙයි. ව්‍යාපෘතිය නිම කිරීම සඳහා රුපියල් මිලියන 3 කට ආසන්න මුදලක් වැය වෙතැයි ගණන් බලා තිබේ. ව්‍යාපෘතිය සඳහා වැය වෙන මුළු මුදල ජනසවි භාරකාර අරමුදලින් (ජේ. ටී. එප්) සැපයීමට එකඟත්වය පළකොට තිබේ.

කැලේගම, ගල්ගමුව ප්‍රාදේශීය මහලේකම් කොට්ඨාශයට අයත් ගමකි. මෙම ගම ගල්ගමුවේ සිට අනුරාධපුර මහා මාර්ගයේ කිලෝ මීටර් 4 ක් ගිය තැන බුදුරුවකන්ද රජමහ විහාරය ඉදිරියෙන් නැගෙනහිරට හැරී යන ගුරු පාරේ ගිය විට හමුවෙයි. ගමේ නමින්ම ග්‍රාම සේවා කොට්ඨාශයක් ද තිබේ. වයඹ පළාත් සභාවට අයත් මෙම ගම් පියස උතුරු මැද පළාතේ සීමාව ආසන්නේ පිහිටා තිබෙන පුරාණ ගම් වලින් එකකි. ඓතිහාසික රජරට යුගයේ ගම්වල තිබුණු සමාජ ආර්ථික වටාපිටාව අදත් මේ ගම්වල දක්නට ලැබේ. කුඩා වැව් ආශ්‍රයෙන් ජීවනෝපාය සළසා ගත් කුලීන පවුල් කීපයක් කැලේගම පැවතෙමින් එන අතර, ඔවුන්ගේ සේවාගම් හාත්පස පැතිරී ඇත. එවැනි ගම් කීපයක් නම්, පාළුගම, (වළං සැපයීම) සියඹලා වැව (රෙදි සේදීම) ලියන් ආගම (බෙර ගැසීම, තොවිල් කිරීම) ආදියයි. මෙම ගම්, බුදුරුව කන්ද රජමහා විහාරය ආශ්‍රයෙන් බිහි වූ, රාජකාරී ගම් ද විය හැකිය. කාලය හා සසඳන විට ඉහත සඳහන් කළ ගම්වල සැළකිය යුතු විපරිනාමයක් සිදුවී ඇතැයි ගැමියෝම නොඅදහති.

ව්‍යාපෘතියේ සියලු කටයුතු අධියර 5 කින් නිම කිරීමට සැළසුම් කර ඇත. ඒ අධියර පහ පිළිවෙලින් මෙසේය.

i. ජල සම්පත් සංවර්ධනය

ii. ප්‍රජා වන වගාව

iii. කෘෂිකාර්මික සංවර්ධනය

iv. පශු පාලනය හා ගෘහ කර්මාන්ත නගා සිටුවීම

v. ආයතනයික සංවර්ධනය තුළින්ම මූලික පහසුකම් දියුණු කිරීම.

කුඩා වැව් පිළිසකර කිරීමට තෝරා ගත්තේ ඇයි ? මුලින් සඳහන් කළ පරිදි වයඹ පළාත් සභාවට අයිති මෙම ගම්මානය වෙනුවෙන් කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් ගත වූ අවුරුදු 50 ක අතීතය තුළ ක්‍රියාත්මක නොවූ බව ගැමියෝම පවසති. එසේ නොකීවත් බැලූ බැල්මට මේ ව්‍යාපෘතියට අයත් ප්‍රදේශයේ ගැමියෝ නොයෙකුත් දුෂ්කරතා මැද ජීවත් වෙන බව පෙනේ. සාමාජික වශයෙන් ගත් කළ කුලභේදය නිසා සමහර ගැමියෝ මුල්ලකට වී ජීවත් වෙන ස්වභාවයක් පෙන්නුම් කරයි. උදාහරණයක් වශයෙන් පාලුගම ගත හැක. මේ ගමේ අයට ආර්ථික වශයෙන් එතරම් දුෂ්කරතා නැතත්, සාමාජික වශයෙන්, කිසියම් අයුරකින් කොන්වී වෙන්වී ජීවත් වන ස්වභාවයක් දක්නට ලැබේ. පොදු හමුවක දී ඉදිරියට විත් පෞරුෂත්වය කින් යුතුව නැගී සිට කථා කිරීමට හැකියාව තිබෙන ගැමියෝ ඇතොත් ඒ ඉතාම කලාතුරකින්ය. කැලේගම ගම්වාසීන් දෙස බලන විට පෙනී යන්නේ ඔවුන් කුළය පෙරදැරි කරගෙන එය ආහාරනයක් සේ සළකා ජීවත් වෙන බවයි. ආර්ථික වශයෙන් ඉතාමත් සරළ මට්ටමක වැඩි දෙනෙක් ජීවත් වෙති. කැලේගම ගම්මුන්ගේ ප්‍රවේණි ඉඩම් අද භුක්ති විඳින්නේ පිටස්තර පුද්ගලයන්ය. හේතුව පරම්පරාගත ඉඩම් විකුණා හෝ උගස් කර තිබීමයි. මීට අමතර වශයෙන් පාලුගම, කැලේගම, හපුකුඹුර, ඉහළගම හා සියඹලා වැව යන

ගම් සියල්ලේම කුඹුරු ඉඩම් අහිමි දෙවැනි පරම්පරාවේ පවුල් සෑහෙන සංඛ්‍යාවක් ජීවත් වෙති. මොවුහු ගොඩ ගොවිතැන්, කුළී වැඩ, (මහවැලි ප්‍රදේශයේ) හා සුළු පරිමාණයේ වෙළඳාම්, වළං විකිණීම, දර සැපයීම, එළු පාලනය, ඌරු පාලනය කිරීමෙන් ජීවිකා වෘත්තිය සළසා ගනිති.

කුඩා වැව් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය දියත් කිරීමෙන් පසු කුඹුරු ඉඩම් හිමි අයට මෙන්ම අහිමි අයටත් යහපතක් සැළසෙතැයි අපේක්ෂා කළහ. ප්‍රදේශයේ පවතින ප්‍රධාන ගැටළු වලින් එකක් සේ උග්‍ර ජල හිඟය සැළකිය හැක. මෙයට තුඩුදුන් එක් හේතුවක් වශයෙන් වැව ක්‍රමයෙන් ගොඩවීම හා පෝෂිත ප්‍රදේශය පුළුල් වීම දැක්විය හැක. වසර ගණනාවක් පැරණි මෙම වැව් එදා සැළසුම් කළේ පවුල් කිහිපයක් වෙනුවෙන් බව එක් එක් වැවක් යටතේ ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය දෙස බැලීමෙන් අවබෝධ කර ගැනීම අපහසු නොවෙයි. ඉහළ වෙළ ආදි වශයෙන් බෙදා වෙන්කර ගත්තේ වැවේ පවතින ජල මට්ටම අනුව සැම අයෙකුටම ගොවිතැනක් කොට වී බිස්ස පිරවීමට අවස්ථාවක් සැළසෙන අයුරින්ය. වැව් පුනරුත්ථාපනය කිරීමෙන් ජල ප්‍රශ්ණයට යම් තරමක හෝ විසඳුමක් ලැබේ යැයි ඔවුහු සිතා සිටියහ.

ව්‍යාපෘතියේ පරමාර්ථ : අධියර පහක් යටතේ ක්‍රියාක්මත කිරීමට නියමිත මේ ව්‍යාපෘතියේ පරමාර්ථ කීපයක් තිබේ. ඒවා කෙටියෙන් මෙසේ සඳහන් කළ හැක.

* කෘෂිකාර්මික හා ගෘහස්ථ කටයුතු සඳහා ජලය සැපයීම
* ප්‍රජා වන වගාව මාර්ගයෙන් ප්‍රදේශයේ පාරිසරික තත්වය දියුණු කිරීම
* ක්ෂෙත්‍ර භෝග හා අතුරු භෝග දියුණු කිරීම
* සත්ව පාලනය දියුණු කිරීම
* ගෘහ කර්මාන්ත හා කලා ශිල්ප වැඩි දියුනු කිරීම
* සාමාජීය වශයෙන් සංවර්ධනයට සුදුසු සංචලතාවයක් සිදුවීමට ඉඩ සැළසීම.

එක් එක් පරමාර්ථයක් සඳහා අධියර වෙන් කර ඇති අතර 1992 ජුලි මාසයේ සිට මේ දක්වා (1993 ජනවාරි) සපුරා ගැනීමට හැකි වූයේ මුල් පරමාර්ථය පමණක් බව සඳහන් කළ යුතුව ඇත. සෙසු පරමාර්ථ සාධනය සඳහා නුදුරු අනාගතයේ දීම පියවර ගනු ලැබේ.

ලිපියේ ඉදිරිපත් කරනු ලබන තොරතුරු හා අත්දැකීම් සියල්ල මෙකී ඉහත දැක්වෙන මුල් පරමාර්ථය සපුරා ගැනීමේ දි මතු වූ කරුණු ආශ්‍රයෙන් සකස් කළ ඒවා බව අවධාරණය කළ යුතුය.

මුල් පරමාර්ථය සපුරාගත් අයුරු හා ප්‍රමාණය : මුල් අදියර යටතේ අපේක්ෂා කළ ඉලක්ක අතරට වැවේ පැති බැම් සුද්ධ කිරීම, සොරොව් අලුතෙන් ඉදි කිරීම, වාන ඉදි කිරීම, මිනුම් කටයුතු සම්පූර්ණ කොට එක් එක් වැවක් යටතේ මූලික වාරිමාර්ග තොරතුරු සම්පූර්ණ කිරීම හා ඇළ පද්ධතියේ හා බැම්මේ ආරක්ෂාව සඳහා කට්ටකඩුව යළි ප්‍රතිෂ්ඨාපනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම ප්‍රධාන තැනක් ගනියි.

මෙම කටයුතු සපුරා ගැනීමේ දී ගැමියන්ගේ සහභාගිත්වය ලබා ගත්තාද ? කිරීමට අපේක්ෂිත කාර්යයන් පිළිබඳව ජනතාව (ග්‍රාමීය) ප්‍රමාණවත් අයුරු දැනුවත් කළාද ? ගැමියන්ගේ දැවුණු අවශ්‍යතාවයන් ව්‍යාපෘතිය තුළින් සපුරා ගැනීමට අවස්ථාව ලැබුණාද ? මෙම ප්‍රශ්ණ කීපයට පිළිතුරු සොයා ගැනීමට ප්‍රයත්න දැරුවොත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමණය කළ එළඹුම එසේත් නැතහොත් භාවිතා කළ ක්‍රමවේදය කුමක්දැයි අනිවාර්යයෙන්ම තෝරාවෙන් කර ගත හැක. ගොවි කටයුතු පර්යේෂන හා පුහුනු කිරීමේ ආයතනය (මින් ඉදිරියට ආයතනය යන වචනය පමණක් භාවිතා කරනු ලැබේ) විසින් 1990 - 91 දී කරන ලද පරිපාලනය විමධ්‍යගත කිරීමෙන් ඇති වූ බලපෑම් නම් වූ අධ්‍යයනයෙන් හඳුනා ගත් අතර, සවිස්තරාත්මක සමාජ ආර්ථික සමීක්‍ෂනයක් පසුව 1992 ජුනි මාසයේ කරන ලදී. ඒ වන විට ද, ව්‍යාපෘතිය දියත් කිරීමට තීරණය කොට තිබිණි. සමීක්ෂණ කාල සීමාව තුළ (මාස 2 1/2) ප්‍රදේශයේ පවතින ගැටළු කීපයක් හඳුනා ගත හැකි විය. එම ගැටළු ගැමියන්ගේ ප්‍රමුඛතාවය අනුව වර්ග කළ විට මෙසේ දිස් වෙයි.

* යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි නොතිබීම
* ගැමියන්ගේ ආර්ථික මට්ටම අසතුටුදායක අදියරක තිබීම
* අඩු සමාජ සමගිය
* පවත්නා භෞතික සම්පත් ප්‍රමාණවත් නොවීම
* (පිටින් පැමිණෙන) නිලධාරීන් කෙරෙහි ඇති අඩු විශ්වාසය.

ගැමියන් විසින්ම මතු කළ ගැටළු පදනම් කරගෙන ඔවුන් සමග පුනරුත්ථාපන ව්‍යාපෘතිය පිළිබඳව සාකච්ඡා කොට ප්‍රතිපෝෂණයක් ලබා ගැනීමට වෙර දැරුවෙමු. ගැමියන් සමග කළ සාකච්ඡාව අවස්ථා 3 ක් යටතේ සිදුවිය. අවස්තා

1. පුද්ගලික ගොවීන් හමුවීම
2. කුඩා කණ්ඩායම් හමුවීම
3 ගම් මට්ටමේ ගොවීන් හමුවීම

* .මේ සැම අවස්ථාවකදීම පුනරුත්ථාපන ව්‍යාපාතිය යනු කුමක්ද ?

* ඒ තුළින් කිරීමට බලාපොරොත්තු වෙන වැඩ මොනවාද ?

* අපේක්ෂිත වැඩ සඳහා මුදල් ආධාර ලැබෙන්නේ කෙසේද ? කාගෙන්ද ?

යන ප්‍රශ්ණ වලට පිළිතුරු සැපයීමට උත්සාහ දැරුවෙමු. මීට අමතරව ගොවීන්ගේ පැත්තෙන් ප්‍රශ්න කීපයක් ඉදිරිපත් විය. ඉන් කිහිපයක් සඳහන් කිරීම යෝග්‍ය යැයි සිතේ. ජනසවිය ආධාර අනාගතයේ දී අහම් වෙයිද ? වැව් පුනරුත්ථාපනය කරන්නේ කොන්ත්‍රාත් පදනමක් මතද? පුනරුත්ථාපනයෙන් පසුව සාධාරණ ලෙස ජලය බෙදා ගැනීමට හැකි වෙයිද? ඉඩම් අහිමි අයට ඉඩම් ලැබෙයිද ? ගොවීන් විසින් මතු කළ ඉහත සඳහන් ප්‍රශ්ණවල යම් ගැඹුරක් හරයක් ඇති බව ඒකාන්තයෙන්ම පැහැදිලිය. ඔවුන්ගේ ඒ සියලුම ප්‍රශ්ණ වලින් පැහැදිලි වෙන එකම කරුණු ආර්තිකය කොතරම් දුර්වලද යන්නයි. දුර්වල ආර්ථිකයක් නිසා පීඩාවට පත් වී සිටින ගොවීන්ගෙන් පුනරුත්ථාපන ව්‍යාපෘතියක් සඳහා සහභාගිත්වය ලබා ගැනීමට වෙර දැරීම කුස ගින්නෙන් හඩා වැළපෙන කිරි දරුවන්ට ජලය පෙවීමට කරන උත්සාහයක් නොවෙයිද ?

වැව් පුනරුත්ථාපනය කිරීම නිසා වැඩි පිරිසකගේ ඉල්ලීමක් සම්පූර්ණ වෙන තත්ත්වයක සිටිනවා යැයි කීමට පුළුවන් කමක් තිබුණා නම් පූර්ණ සහභාගීතවයක් ගැන යම් තරමක හෝ විශ්වාසයක් තැබිය හැක. ගැමියන්ගේ සහභාගිත්වය නොලැබුණා යයි මින් අදහස් නොවෙයි. වැව් වල වාන වෙනස් කිරීම, කට්ට කඩුව නැවත පිහිටුවීම, රක්ෂිතය වෙන් කිරීම ආදි තැන් වලදී ගැමියන්ගේ සහභාගීත්වය සතුටුදායක අන්දමින් ලැබුණි.

ව්‍යාපෘති කාලය තුළ නිම කළ සැම කාර්යයක්ම ප්‍රදේශවාසීන්ගේ සහභාගිත්වය-ඇතිව කළත් ඒ සැම කාර්යයක් සඳහාම මුදලක් ගෙවීමට සිදු විය. ආයතනය පැත්තෙන් බලන විට මෙය සතුටු දායක සහභාගිවීමක් සේ ගණන් ගත නොහැකිය. ඇතමෙකුට මෙය යොදාගත් එළඹුමේ අඩුපාඩුවක් නිසා සිදු වූවකැයි කියා ප්‍රශ්ණය වෙනතකට යොමු කිරීමට ද ඉඩකඩ තිබේ. එහෙත් ගොවීන්ගේ පැත්තෙන් බලන විට "පූර්ණ සහභාගීත්වයක්" ගැන අපේක්ෂා ගොඩ නැගීමට සුදුසු වටපිටාවක් (සමාජ ආර්ථික හා භෞතික) ව්‍යාපෘති ප්‍රදේශය තුළ තිබේ ද යන ප්‍රශ්ණය ඊට කලින් ඇසිය යුතුව ඇත. සංවර්ධන ව්‍යාපෘතියක් යනු ප්‍රදේශයේ ජනතාවගේ ශ්‍රමය නොමිළේ ලබා ගැනීම ද?

එදිනෙදා වේල සොයා ගැනීමේ ගැටළුවලට මුහුණ දී සිටින දුප්පත් ගොවියාගේ අවශ්‍යතා ලැයිස්තුවේ වැව සෑදීම ඇතුළත් වී තිබුණා ද නැද්ද යන්න ප්‍රශ්ණයකි. එදා වේල සොයා ගෙන තම පවුල නඩත්තු කිරීම, ප්‍රමුඛතා ලැයිස්තුවේ ඉදිරියෙන්ම තිබෙන බවට කිසිදු සැකයක් නොමැත. මේ හේතුව නිසාම පැළ (කොහොඹ, කුඹුක් වැනි) සිටුවීමට, පස සුද්ධ කිරීමට තමාගේ ගමේ ගොඩ නැගෙන වැවේ වේල්ල පිළිසකර කිරීමට මුදලක් ගෙවීමට සිදුවිය.

මෙහිදී අවධානය යොමු වන ප්‍රශ්ණය ගොවියාට දවසකට රුපියල් 75/- ක් වැනි මුදලක් ගෙවීමට සිදුවීම නොවෙයි. ගැටළුව නම් මුදලක් ගෙවීමෙන් පසුවත් අවශ්‍ය අයුරින් කාර්ය සම්පූර්ණ නොවීමයි. තමාගේ වැව පිළිසකර කර ගැනීමට කුලියක් දීමෙන් අනතුරුවත්, ඔවුහු තම වගකීම හරියාකාරව ඉෂ්ට නොකළේ මන්ද ? ඊට හේතුව ව්‍යාපෘතිය හඳුනා ගැනීම පිටස්තර පුද්ගලයන් කළ නිසාද ? එසේත් නැතහොත් බහුතරය නව ප්‍රතිඵලයක් අත්වෙන අයුරින් ව්‍යාපෘතිය හඳුනා නොගත් නිසාද ? එසේත් නැතහොත් ගැමියන්ගේ ආකල්ප වල පරිවර්තනයක් ඇති කිරීමට අපොහොසත් වීමද ?

ඉහත ඉස්මතු කළ ප්‍රශ්ණවලට පිළිතුරු සැපයීමට තවත් කල් තිබේ යැයි සිතේ. මක් නිසාද යත්, ව්‍යාපෘතියේ පළමු අදියරේ අවසාන භාගයට තවමත් අවතීර්ණ වී නොමැති නිසයි.

කෙසේ නමුත් 1992 ජූලි මාසයේ සිට 1992 දෙසැම්බර් දක්වා කාලය තුළ මිනිස් දින 3273 (ශ්‍රමිකය) වැනි වැය කොට තිබේ. ඒ මාර්ගයෙන් සම්පූර්ණ කළ කටයුතු මොනවාද

**ලබාගත් ප්‍රයෝජන :** පුනරුත්ථාපනය සඳහා තොරාගත් වැව් පහේම සොරොව් 9 ක් අළුතින්ම ඉදි කරන ලදී. ඒවාට අවශ්‍ය 9" ප්‍රමාණයේ ගේට්ටු සවිකොට වැව් බැඳීමට පස් දමා තළා සකස් කිරීමට හැකි විය. මෙතෙක් ගොවියන්ට ප්‍රශ්ණයක්ව පැවති වතුර කාන්දුවීම අවම කිරීමට නව සොරොව් ප්‍රයෝජනවත්ව තිබේ. පුපුලවැටිය වැනි වැව් වල වාන වෙනස් කොට එතෙක් සිදු වූ වගා පාලුව මගහරවා ලීමට අවස්ථාවක් ලැබුණි. නාන තොටුපලවල් 6 ක් ඉදිකළ අතර එක් තොටුපළක් නවීකරණය කරන ලදී මෙම පුනරුත්ථාපන වැඩ නිසා විශාල පිරිසකට දෛනික වැටුපක් ලබා ගැනීමට හැකි වීමෙන් තාවකාලිකව හෝ ඔවුන්ගේ ආර්ථික ගැටළුවට විසඳුමක් ලැබුණු බව සඳහන් කළ හැකියි.

**ලබාගත් අත්දැකීම් :** ව්‍යාපෘතිය නිසා ලැබුණු අත්දැකීම් අතර ශුභ ඒවා මෙන්ම අශුභ ඒවාද වෙයි. දීර්ඝ කාලයකට පසුව වැව් 5 ක් පුනරුත්ථාපනය කිරීම නිසා මාස් කන්නයේ හොඳින් වැසි ලැබුණොත් සාර්ථක අස්වැන්නක් නෙළා ගැනීමට සුළු පිරිසකට හෝ දැන් පුළුවන් කම ලැබේ.

ගෘහස්ථ කටයුතු සඳහා, විශේෂයෙන් නෑමට සේදීමට ප්‍රමාණවත් තරම් ජලය රඳවා ගැනීමට අළුතෙන් ඉදිකළ සොරොව් ප්‍රයෝජනවත් වනු ඇත. ගැමියන්ගේ ජල ප්‍රශ්නය යම් තරමකට හෝ විසඳීමට මෙම ව්‍යාපාතිය ඉවහල් වී ඇති බව අතිශයෝක්තියක් නොවෙයි.

ප්‍රදේශයේ පවතින කාලගුණික තත්වය අනුව වැව් පුනරුත්ථාපනය කළ පමණින් කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති නොවන්නේය. ඊට හේතුව නම් එදා සැලසුම් කළ මේ කුඩා වැව් අද සීඝ්‍රව සිදුවී තිබෙන ජනගහණ වර්ධනය තුළින් මතුවී තිබෙන ප්‍රශ්ණවලට විසඳුමක් ලබා දෙන්නේ ද යන සැකයයි.

ගැමියන් තුල එකිනෙකට පරස්පර අදහස් ක්‍රියාත්මක වූවා සේම ව්‍යාපාතියට හවුල් වූ නිලධාරීන්ගේ හැසිරීම් රටාවේද පරස්පරතා කැපී පෙනෙන්නට තිබුණි. උදාහරණයක් වශයෙන් කෙනෙක් කණ්ඩායම් එළඹුම විශ්වාස කළ අතර අනිත් පුද්ගලයා එය යෝග්‍ය උපාය මාර්ගයක් වශයෙන් පිළිගත්තේ නැත. සමාජ ආර්ථික පර්යේෂන කරන ආයතනයක් වාරිමාර්ග පද්ධතියක් පුනරුත්ථාපනය කිරීමට යාමේදි ගැටළු රාශියකට මුහුණදීමට අනිවාර්යයේම සූදානම් විය යුතුය. භාණ්ඩ මිලදී ගැනීම, සපයා ගැනීම, ප්‍රවාහණය කිරීම ආදි සියල්ලක් පර්යේෂකයෙකුට නව විෂයයන් බවට අමුතුවෙන් කිව යුතු ද ? මෙය අත්හදා බැලීමේ මට්ටමෙන් කළ ක්‍රියාත්විත පර්යේෂනයක් යැයි මොහොතකට සිතුවොත් අනාගතයට ප්‍රයෝජනවත් වෙන කරුණු කිහිපයක් පිළිබඳව අවධානය යොමු කිරීම යෝග්‍ය වෙයි.

ඒවා නම්,

1. ව්‍යාපෘතියක් හඳුනා ගැනීම කරන අවධියේ දී අදාල ගැමියන්ගේ/ප්‍රතිළාභීන්ගේ අදහස් සවිස්තරාත්මකව විමසා බැලීම.

2. ව්‍යාපෘති පරමාර්ථ තීරණය කිරීම, ප්‍රදේශයේ පවතින සම්පත් හා භෞතික ලක්ෂණ අනුව බල කිරීමෙන් සාර්ථක සහභාගිත්වයක් ලබා ගත හැක.

3. ව්‍යාපෘතිය සඳහා යොදා ගන්නා ක්‍රමවේදය/එළඹුම පිළිබඳව හවුල් වෙන ගම්මුන්ට මෙන්ම නිලධාරීන්ට ද පැහැදිළි අවබෝධයක් තිබීම අපේක්ෂිත අරමුණට ළඟාවීමට පහසුවක් වෙයි.

4. ව්‍යාපාතිය ක්‍රියාත්මක වෙන කාලපරිච්ඡේදය තුළදී වරින් වර විපරම් කිරීම හා ලබා ගන්නා අත්දැකීම් ආශ්‍රයෙන් ගමන් මග වෙනස් කිරීම දිගු කල් පැවැත්මට ආධාරකයක් වෙයි.

යන කරුණු වේ.




අයාලේ යන ගවයන්